# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1994 අංක 3 දරන
# පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1994 පෙබරවාරි මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1994 පෙබරවාරි මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ගත හැක.

මිල : ශත 90 යි. තැපැල් ගාස්තුව : 1.00 යි.

# 1994 අංක 3 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1994 පෙබරවාරි මස 23 වන දින]

**එල් ඩී.—ඕ. 37/91**

**1956 අංක 46 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1994 අංක 3 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1956 අංක 46 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1956 අංක 46 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේද ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්:—

"(ආ) යහපත් චරිතයකින් යුක්ත වේ නම්;

(ඇ) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ හෝ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය විද්‍යාවේදී උපාධිය හෝ පාලක සභාව විසින් අනුමත කරනු ලැබූ වෙනත් සුදුසුකම් දරන්නකු වේ නම්; සහ

(ඈ) (4) වන උපවගන්තිය යටතේ පාලක සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නකු වේ නම්.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්;

(3) ඒ වගන්තියේ ඉවත් කරනු ලැබූ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:—

"(3) යම් තැනැත්තකු (4) වන උපවගන්තිය යටතේ වූ සහතිකයක් පාලක සභාවෙන් ලබා ගැනීම සඳහා නියමිත යම් පළපුරුද්දක් ලබා ගැනීමේ කාර්යය සඳහා පමණක් එකී කාර්යය සඳහා පාලක සභාව වෙත කරන ඉල්ලීමක් අනුව, එකී තැනැත්තා (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් නියමයන් සපුරාලන්නේ නම්, ඔහු මාස හයක කාලපරිච්ඡේදයක් සඳහා පශු වෛද්‍යවරයකු වශයෙන් තාවකාලිකව ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(4) පශු වෛද්‍යවරයකු වශයෙන් තාවකාලිකව ලියාපදිංචි කරන ලද යම් තැනැත්තකු, මේ උපවගන්තිය යටතේ වූ සහතිකයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කරන අවස්ථාවක, ඉල්ලුම්කරු

2—ඩී 028868 5,405 (93/09)

නියමිත ආයතන එකක හෝ වැඩි ගණනක නියමිත කාලය තුළ පශු වෛද්‍ය විද්‍යාව, පශු ශල්‍ය වෛද්‍ය විද්‍යාව, සත්ව විද්‍යාව සහ පශු සම්පත් සංවර්ධන යට අදාළව යම් තත්ත්වයකින් සේවයෙහි නියුක්ත වූ බවට සහ එසේ සේවයෙහි නියුක්තව සිටි අතරතුර සතුටුදායක සේවයක් ඉටුකර ඇති බවට සෑහීමට පත්වූ විට, පාලක සභාව විසින් ඒ බවට, නියමිත ආකෘතියෙහි වූ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) (1) වන වගන්තියෙහි වූ කිසිවකින්, ඒ උප වගන්තිය බලාත්මක වන දිනට පෙර පශු වෛද්‍ය වෘත්තිකයකු වශයෙන් යම් තැනැත්තකු නාම ලේඛනයෙහි ලියාපදිංචි කිරීම කෙරෙහි බලපෑමක් ඇති නොවිය යුතුය ; නැතහොත් බලපෑමක් ඇති වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.*

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

*" ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීම.*

3. පශු වෛද්‍යවරයකු හෝ පශු වෛද්‍ය වෘත්තිකයකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීම් ලේඛකාධිකාරී වෙත යොමු කළ යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

*" ලියාපදිංචි කිරීමේ ගාස්තුව.*

4. නියමිත ගාස්තුව ගෙවනු ලැබුවහොත් මිස, කිසිම තැනැත්තකු පශු වෛද්‍යවරයකු වශයෙන් හෝ පශු වෛද්‍ය වෘත්තිකයකු වශයෙන් ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ඉවත් කිරීම.*

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

*" තාවකාලික ලියාපදිංචි කිරීම.*

6. (1) තාවකාලික ලියාපදිංචි කිරීමට අදාළ පාලක සභාවේ කටයුතු ලේඛකාධිකාරී වෙත පැවරීමේ බලය පාලක සභාව සතු විය යුතු ය.

(2) යම් තැනැත්තකුගේ නම, නාම ලේඛනයෙන් ඉවත් කරනු ලැබ, ඉන්පසුව, ඔහුගේ නාම අලුත් ලියාපදිංචි කිරීමක් මඟින් නාම ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබූ අවස්ථාවක, ඒ අලුත් ලියාපදිංචි කිරීම කලින් ලියාපදිංචි කිරීමේ අලුත්

කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය. එකී ලියාපදිංචි කිරීම සඳහා වූ ගාස්තුව නියම කරනු ලැබිය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන සහ 8 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන සහ 8 වන වගන්ති ප්‍රතියෝජනය කිරීම.

"ප්‍රතික්ෂේප කරනු ලැබීමේ දී ගාස්තුව ආපසු ගෙවීම.

7. ලියාපදිංචි කිරීම සඳහා වූ යම් ඉල්ලීමක් පාලක සභාව විසින් පිළිගනු නොලැබූ අවස්ථාවක, ඉල්ලුම්කරු විසින් ගෙවනු ලැබූ ගාස්තුව ඔහු වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

ලියාපදිංචි කිරීම ජීවිත කාලය සඳහා වලංගු විය යුතු බව.

8. යම් පශු වෛද්‍යවරයකුගේ හෝ පශු වෛද්‍ය වෘත්තිකයකුගේ ලියාපදිංචි කිරීම, පාලක සභාව විසින් ඔහුගේ නම නාම ලේඛනයෙන් ඉවත් කරනු නොලැබුවහොත්, ජීවිත කාලය සඳහා වලංගු විය යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (2) වන සහ (3) උපවගන්ති ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) පාලක සභාව සඳහා සහ ඒ වෙනුවෙන් ලේඛකාධිකාරී විසින් නාමලේඛනය පවත්වාගෙන යනු ලැබිය යුතු ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ලේඛකාධිකාරීගේ කාර්යය.

10. පශු වෛද්‍යවරුන් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා 3 වන වගන්තිය යටතේ ඉල්ලීම් කරනු ලැබ ඇත්තා වූ ද, පාලක සභාව විසින් ඒ ඉල්ලීම පිළිගනු ලැබ ඇත්තා වූ ද, යම් තැනැත්තන්ගේ නම්, ලිපිනයන් සහ සුදුසුකම් ලේඛකාධිකාරී විසින් පශු වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා වූ ලේඛනයේ නියමිත කොටසෙහි ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන, 12 වන, 13 වන සහ 14 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන, 12 වන 13 වන සහ 14 වන වගන්ති ඉවත් කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ශ්‍රී ලංකා පශු වෛද්‍ය පාලක සභාව සංස්ථාපනය කිරීම.

15. ශ්‍රී ලංකා පශු වෛද්‍ය පාලක සභාව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු වූද, පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු වූ ද, පාලක සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය :—

(අ) සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තා ;

(ආ) මේ පනත යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව ලියාපදිංචි පශු වෛද්‍යවරුන් විසින් තෝරා පත්කර ගනු ලබන ලියාපදිංචි පශු වෛද්‍යවරුන් අට දෙනකු ; සහ

(ඇ) පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තා.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"පාලක සභාවේ සාමාජිකයන්ගේ ධූර කාලය.

17. (1) පාලක සභාවේ යම් තෝරාපත් කරගත් සාමාජිකයකු, ඔහු කලින් ධූරය හිස් කරනොත් මිස, තෝරාපත් කර ගනු ලැබූ දින සිට අවුරුදු හතරක් හෝ ඔහුගේ අනුප්‍රාප්තිකයා තෝරාපත් කරගනු ලබන දිනය තෙක් හෝ ධූරය දැරිය යුතු ය.

(2) කාලය ඉකුත්වීමෙන් ධූරය හිස් කරන පාලක සභාවේ යම් තෝරා පත්කරගත් සාමාජිකයකු, නැවත තෝරාපත් කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(3) පාලක සභාවේ යම් සාමාජිකයකු,—

(අ) ඔහු, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය පීඨයේ පීඨාධිපති නම්, ඒ ධූරය දැරීම නතර වුවහොත් ;

(ආ) ඔහු, සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සභාපති හෝ අධ්‍යක්ෂ නොවන වෙනත් යම් සාමාජිකයකු නම්, පාලක සභාවේ සභාපති අමතා යවනු ලබන ලියවිල්ලක් මගින් සිය ධූරයෙන් ඉල්ලා අස්වුවහොත් ;

(ඈ) ඔහු, පාලක සභාවේ සභාපති නම්, අමාත්‍ය වරයා අමතා යවනු ලබන ලියවිල්ලක් මගින් සිය ධූරයෙන් ඉල්ලා අස්වුව හොත් ; හෝ

(ඇ) ඔහු, තෝරා පත්කරගත් සාමාජිකයකු නම්, පාලක සභාවේ අනුගාමී රැස්වීම් තුනකට පාලක සභාවේ අවසරයක් නොමැතිව පැමිණ නොසිටියහොත්

ස්වකීය ධූරය හිස් කරන්නේ ය.

(4) පාලක සභාවේ යම් තෝරාපත් කරගත් සාමාජිකයකු මියගියහොත් හෝ ධූරය හිස්කල හොත්, ඒ සාමාජිකයා වෙනුවට වෙනත් යම් තැනැත්තකු 16 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව තෝරාපත් කරගනු ලැබිය යුතු අතර, ඔහු ඒ සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉතිරි කොටස තුළ ධූරය දැරිය යුතුය.".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු වගන්තිය ඉවත් කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) පාලක සභාවේ සාමාජිකයන් අතුරින් යටත් පිරිසෙයින් සාමාජිකයන් පස් දෙනකු හෝ පැමිණ සිටියහොත් මිස, පාලක සභාවේ යම් රැස්වීම කදී කිසිම කටයුත්තක් කරනු නොලැබිය යුතුය." ; තවද,

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "යම් සාමාජිකයකු තෝරා පත්කර ගැනීමේ හෝ නම් කිරීමෙහි ලා" යන වචන වෙනුවට, "යම් සාමාජිකයකු තෝරා පත්කර ගැනීමෙහි ලා" යන වචන ආදේශ කිරීමෙන්.".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ "15(1) වන වගන්තියෙන්" යන වචන හා ඉලක්කම් වෙනුවට, "15 වන වගන්තියෙන්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"පාලක සභාවේ අරමුදල්. 21. ලියාපදිංචි කිරීම සඳහා ලේඛකාධිකාරී වෙත ගෙවන ලද සියලු ගාස්තු පාලක සභාවේ අරමුදල් වලට බැර කරනු ලැබිය යුතු අතර, පාලක සභාවේ

කාර්ය මණ්ඩලයේ පාරිශ්‍රමික, මේ පනත යටතේ එහි බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ එහි කාර්ය ඉටු කිරීමේ දී පාලක සභාව විසින් දරන ලද සියලු වියදම් සහ යම් නියමිත කාර්යයක් වෙනුවෙන් දරන ලද වියදම් ඒ අරමුදල් වලින් ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය ඉවත් කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 25අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 25අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"පාලක සභාව විසින් විශ්ව විද්‍යාලයට නිර්දේශ ඉදිරිපත් කළ යුතු බව.

25අ. පේරාදෙණිය විශ්ව විද්‍යාලය විසින් පවත්වනු ලබන පාඨමාලා අගැයීමේ සහ ශ්‍රී ලංකාවේ පශු වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ කරුණු පිළිබඳව කලින් කල විශ්ව විද්‍යාලයට නිර්දේශ ඉදිරිපත් කිරීමේ බලය, පාලක සභාව සතු විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ලියාපදිංචි කිරීමේ නිලධරයාට හෝ ලේඛකාධිකාරීට" යන වචන වෙනුවට, "ලේඛකාධිකාරීට" යන වචනය ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "ලියාපදිංචි කිරීමේ නිලධරයා හෝ ලේඛකාධිකාරී" යන වචන යෙදෙන කවර තැනක වුවද, ඒ වෙනුවට, "ලේඛකාධිකාරී" යන වචනය ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"අතිරේක සුදුසුකමක් ඇතුළත් කිරීම.

29. නාම ලේඛනයෙහි සඳහන් තම සුදුසුකමට අතිරේකව යම් සුදුසුකමක් ලබාගන්නා ලියාපදිංචි පශු වෛද්‍ය නිලධරයකු, එකී නාම ලේඛනයෙහි සඳහන් තම සුදුසුකම්වලට එකී අතිරේක සුදුසුකම ඇතුළත් කර ගැනීමට, එකී අතිරේක සුදුසුකම පාලක සභාව විසින් අනුමත කරනු ලබන අවස්ථාවක, හිමිකම් ලැබිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ (2) වන උපවගන්තිය අගට පහත දැක්වෙන ඡේද එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ඌ) යම් සතකු ගැබ්වනු ගැසීම් හා රූ කෙටීම;

(එ) යම් සතකුගේ සුළු තුවාලවලට පිළියම් කිරීම.".

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ යෙදෙන "ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ හෝ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "ලියාපදිංචි කිරීමේ නිලධරයා හෝ ලේඛකාධිකාරී" යන වචන වෙනුවට, "ලේඛකාධිකාරී" යන වචනය ආදේශ කිරීමෙන් ; සහ

(2) "ඔහුගේ ලියාපදිංචි කිරීම අලුත් කිරීම" යන වචන අත් හැරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ යෙදෙන "දෙසිය පණහක්" සහ "පන්සියයක්" යන වචන වෙනුවට, පිළිවෙලින්, "පන්සියයක්" සහ "එක් දහසක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තියේ (2) වන උප වගන්තියේ (අ) ඡේදය ඉවත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

'අර්ථ නිරූපණය.

41. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස, මේ පනතෙහි—

"සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ" යන්නෙන්, සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අධ්‍යක්ෂ වශයෙන් හෝ අධ්‍යක්ෂ ලෙස ක්‍රියා කිරීමට හෝ පත් කළ තැනැත්තා අදහස් වේ ;

"අමාත්‍යවරයා" යන්නෙන්, සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය විෂයය පවරා ඇති, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද අමාත්‍යවරයා අදහස් වේ ;

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියමිත බව අදහස් වේ ;

"සභාපති" යන්නෙන්, ශ්‍රී ලංකා සභාවේ සභාපති අදහස් වේ ;

"ලේඛකාධිකාරි" යන්නෙන්, පාලක සභාව විසින් පත් කරන ලද ලේඛකාධිකාරි අදහස් වේ;

"ලියාපදිංචි පශු වෛද්‍ය වෘත්තිකයා" යන්නෙන්, මේ පනත යටතේ පශු වෛද්‍ය වෘත්තියකු වශයෙන් ලියාපදිංචි කරන ලද තැනැත්තකු අදහස් වේ;

"ලියාපදිංචි පශු වෛද්‍යවරයා" යන්නෙන්, මේ පනත යටතේ පශු වෛද්‍යවරයකු වශයෙන් ලියාපදිංචි කරන ලද තැනැත්තකු අදහස් වේ;

"පාලක සභාව" යන්නෙන්, මේ පනත යටතේ සංස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා පශු වෛද්‍ය පාලක සභාව අදහස් වේ.'.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

26. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල හැන්සාඩ් කොටුම්පත්වල සහ හැන්සාඩ්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. [illegible] ශත. (විදේශීය) රු. 1.160 ශත. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නව වර්ෂයකට දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර අගය මුදල් ගෙවා පසුව නිකුත්වන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.